




සිසිර දිසානායක

# බුද්ධ ජයන්තියට ඉල්ලීමක්

"මෙදා පාර නම් මට මඟදී
බහින්න තරමට හිතුණා" පන්හින්ද ඕලාරික ගතිය යන්න අත පය දිග ඇරියා"

"මටත් .......!" පින්සලත් කතාවට එකතු වුණා.

"යනවා යනවා ඉවරයක් නෑ. කොයි වෙලාවෙද බහින්නෙ කියලයි මාත් උන්නෙ"

"කරන්න කියල දෙයක් තිබුණ නං වෙලාව යනවා තේරෙන්නෙ නෑ. මඟදි නිදාගන්න හිතාන ගියාට හිතේ අස්වැසිල්ලක් තිබුණායැ නිදගන්න ?" පන් කිව්වා.

"අපේ ජීවිතත් ඔය වාගේ තමයි ..." පැන්සලත් කොහේදෙ ඉඳලා එතෙන්ට ආවා. අපි මේ යන ගමනෙ වේගෙ මදි කියලා හිතුණාම යන වාහනෙන් බැහැලා දුවන්න තරමට හිතෙනවා. කරන්න හරියමං වැඩක් නැතිවුණාම මේ යන ගමනේ ඉවරයක් දකින්නෙ කොයි වෙලාවෙද කියලා හිතෙනවා. ඇත්තටම අන්ත දෙකක කතා දෙකක් බලාපොරොත්තු පොදි බැඳගෙන දුවන තරඟයක දී ඉස්සරහට කරන්න තියෙන දේවල් මතක් වෙනකොට නින්ද යන්නෙත් නෑ...." පැන් බර කතාවකට අර අඳින්න හරි බරි ගැහුණා.

මේ අය මේ කතා වුණේ තුන්දෙනා එක්කම ලංකාවට අහස්යාත්‍රාවෙන් ගිය ගමන ගැන. පන්ගේ මව් අන්තරා වෙලා අවසන් කටයුතු කරන්නයි මේ ඈයෝ හදිස්සියෙන් ම ලංකාවට ගියේ. ඒ කටයුතු අහවර කරලා ආපහු ඇවිත් ඒ සිහියෙනුයි තාමත් මේ ඈයෝ ඉන්නෙ.

ලංකාවෙන් රට රටවලට සංක්‍රමණය වෙලා ඉන්න මේ වයසේ; මේ පරම්පරාවේ කාටත් තියෙන, කාටත් දැනෙන ප්‍රශ්ණයක් තමා උපන් රටේ ඉන්න තමුන්නෙ දෙමව්පියන්නෙ ප්‍රශ්ණය. වයසට ගියාම එන ලෙඩ රෝග එක්ක හටන්වදින අම්මා " අප්පා ගැන මෙහෙ ඉඳන් කරන්න පුලුවන් දේ සීමා සහිතයිනේ. පන් ලියන්න පටන්ගත්තා.

"ගිලන්ව රෝහල්ගතව සිටි සිය මව් දැක හැඟීම්බර වුණ ප්‍රේමකීර්ති/ද අල්විස් ප්‍රවීණයා " ආදරයේ උල්පත වු අම්මා" ගීතය නිබන්ධනය කළ බැව් වික්ටර් රත්නායකයන් කියන්නේය. තමා ඇසු නැළවිලි ගී තනුවක් ඇසුරින් ඊට තනුවක් නිර්මාණය කරගෙන එය ගැයු බවද අල්විස් නිබන්ධකයාණන් සංවේදී කරවුයේ කවුරුන් ද ? තමාට ගැයු නැළැවිලි ගීයක් රත්නායකයන්ට සිහිගැන් වුයේ කවුරුන් ද? මව් " දෙමව්පියන් නොවේ ද?

"නිල් දියවර" ගී එකතුව එළි දැක් වුයේ මීට වසර දහයකට පමණ පෙරදී ය. ඒ වෙනුවෙ-න් කළ ගුවන් විදුලි වැඩ සටහනකට සහභාගී වු කරුණාරත්න දිවුල්ගනේ ගායන ශිල්පියාණන් සිය ගී පිළිබඳව අදහස් දක්-වමින් සිටියේය. වැඩසටහන මෙහෙය වු නිවේදකයා මෙහිදී ගී එකතුවෙහි වු මව් ගුණ ගීතය වන "ගමට කලින් හිරු මුළුතැන් ගෙට වඩිනා" ගීතය වෙත දිවුල්ගනේ ශිල්පියාණන්ව යොමු කරවීය. අතිශයින් ම හැඟීම්බර වු දිවුල්ගනේ ශිල්පියාට ඉන් එහාට කතා කරගත නොහැකි වුයෙන් සෑහෙන වේලාවක් ගී පමණක් ප්‍රචාරය කරමින් වැඩ සටහන ඉදිරියට ගෙනයාමට නිවේදකයාට සිදු විය. දිවුල්ගනේ ශිල්පියාගේ මව් ඒ වන විට වියෝ වී තිබිණ. ඔහුව එද හැඟීම් බර කරවුයේ කවුරුන් ද ?

මේ හා සමාන සිදුවීමක් මීට වසර කීපයකට පෙර මෙල්බර්න් හී දී ද සිදුවිණ. ධම්ම හා ප්‍රේමා කටුගම්පළ යුවලගේ නිවහනේ පැවැත් වු ගීත සාජ්ජයකදී අප හට ද ගයන්නට ඇරයුම් ලැබිණ. ගුණදස කපුගේ විශාරදයන් ගැයු "දවසක් පැල නැති හේනේ" ගීය ගයන්නට මුල පිරූවද එය ගැයීමට නොහැකි විය අප හට. කිසිවෙකුට නොකියා සිටි දෙයක් ඒ වෙලාවේ රැස්ව සිටියවුනට කීමට සිදුවීය. එද අපගේ උපන් දිනය බවත් ඒ නිසාවෙන් දයාබර මෑණියන් සිහිපත් වු බවත් ය ඒ.

කාගේ වුවද උපන් දිනයකදී මුලින් ම සිහිපත් විය යුත්තේ තමුන්ගේ මවයැයි අපට සිතෙයි. ඒ හා ම තමාට ජාන ශක්තියෙන් ජන්මය ලබාදුන් පියාණන්ව ද සිහියට නැගෙයි.

අපගේ නහරවැල් පුරා දිවයන රුහිරය බිඳක් පාසා ඔවුන්ගේ නො-වේද? අපට ශාරීරික සැකිල්ල සපයන මේ අස්ථි පංජරය ඔවුන්ගේ නො-වේද? ඒ වසා සිටිනා මාංශදේහය, සම්, කෙස්, පංචේන්ද්‍රිය, මස්තිෂ්කය අප ලැබුයේ කාගෙන් ද? අප මේ සියලු ශිල්ප දක්වන්නේ දෙමව්පියන්ට පින්සිදුවන්නට නොවේද ? ඒ ඔවුන් අපට දුන් දයාද නිසාවෙනි. ලෝකයේ කොන්දේසි රහිතව, ප්‍රති උපකාර රහිතව කෙනෙකුට පිදෙනා එකම නිර්මල ආදරය දෙමව්පියන්ගේ ආදරයයි. ලෝකය පවතින්නේ හිරුකිරණින් හා මව් කිරෙන් යැයි රුසියානු ජාතික මැක්සිම් ගෝර්කි මහා ලේඛකයා ලීවේය.

"ලෝකයෙ ගහ කොල පීදෙයි
ඉර පායන හන්ද
පුද ලොවට කිරේ මහිම
නුඹ සැනසේ දේ
හිරු කිරණ ද පරද ....

ගෝර්කි ලේඛකයාණන් ලිව් දේ අපට සිතෙන්නේ එලෙසිනි. ලොවට වඩමවා, වඩා, උගන්වා, තමන් රිසි සේ පියඹා යන්නට ඉඩ හරිනා කුරුළු ජෝඩුවක් සේ මව් පියෝ තමන් වියපත් වන ද අසරණ වන වග නොදැන නොවේ.

"මා මිනිසෙකු කරන සිතින්
අඟුලු පියන් හැර ද
මගේ ඇඳුම් පොඩි සිපගෙන
නුඹ හැඬුවාලු
මා ගෙදරින් ගිය ද ..."

මෙරටට සංක්‍රමණය වීමෙන් පසුව ලියැවුණ " කිරි මදුවැල් කිරිවැරුවත්" ගීතය වික්ටර් රත්නායකයන්ගේ හඬින් ඇසු මුල් වතාවේදී අප මෑණියන් අප හා කීයේ තමන් සැබැවින්ම




අපගේ ඇඳුම් පොඩි සිපගෙන හැඬු බවත් ඒ හැඬුයේ අප ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් ව හයවන ශ්‍රේණියට ඇතුලත් වන්නට අගනුවර විද්‍යාලයකට ගිය දිනයේ දී බවත් ය. එනයින් ගත් කල ඇය අපව මුදවා ඇත්තේ හයවන ශ්‍රේණියේ සිසුවකුව සිටිනා කාලයේදීමයි.

සංක්‍රමණය වු පසුව අප හට දැනෙන වියෝව හා සාංකාව වැඩි වශයෙන්ම අපහට දැනෙන්-න් දෙමව්පියන් පිළිබඳව සිහිවන කල්හිය. ඔවුන් රැක බලාගැනීම සහෝදර සහෝදරියන් සිටිනා කල නම් වගකීම සෑහෙන දුරට අඩු වුවද යුතුකම් කොටසනම් අඩු කළ නොහැක. මුල්‍යමය වශයෙන් හා විදේශගත දරුවන් ඇතැයි යන සිතුවිල්ල මත මානසික වශයෙන් ඔවුනට සවියක් විය හැකි වුවද දෙමව්පියන් හා දුක " සැප බෙද හදාගෙන ඔවුන් හා රැඳී සිටීමට ලැබෙනා අවස්ථාවන් අඩු වී යයි, සංක්‍රමණිකයන්ට.

අසාධ්‍ය තත්ත්වයේ සිටි සිය මව් බැලීමට ගියද අවසන් හුස්ම හෙළීමට කලින් රෝහලට ගොස් මව බැහැදැකීමට නොහුණු අපගේ මිතුරෙකුගේ කථාවක් අපි දනිමු. සිය පුතු මව් බිමට පැමිණි බව පවා දත් ඇයට ඔහු රෝහලට එනතුරු ජීවත්වීමට වරම් නොලැබිණ. මේ වන් දේ පිළිබඳව සල්ලාපයෙහි යෙදී සිටි එක් අවස්ථාවක අප මිත්‍ර ප්‍රියන්ත ප්‍රනාන්දු කීවේ දෙමව්පියන් වියපත් වු කල, ගිලන් වු කල ඔවුන් බැලීමට හැකි සෑම විටම යාම සියල්ලන්ගේ ම සැනසිල්ලට හේතුවන බවයි.

ඊට කාලය හා මුදල් ඉතිරිකර ගැනීම අභියෝගයකි. මව් අසනීපයෙන් සිටින නිසා "කොයි වේලේක" හෝ යන්නට සිදුවන බැවින් නිවාඩු හා මුදල් ඉතිරි කරමින් සිටිනා පුද්ගලයෙකු අපට හමු විය. මෙහිදී ඔහු "කොයි වේලේක" යන්නෙන් අදහ් කළේ මව්ගේ වියෝ-වයි. ඇය මිය යන්නට කලින් ඇය ව බැහැ දුටුවානම් නොවේද වටිනාකම? එලෙස ගියේ නම් අවසන් කටයුතු වලට "පෙනී සිටිනවාට" වඩා වටින්නේ යැයි අපගේ හැඟීමයි. ඔහුව දුටුවේ නම් ඇය තවත් දිනක් හෝ වැඩිපුර ජිවත් වනු ඇත. අවසන් කටයුතුවලට පෙනී සිට ලෝකාපවාදයෙන් මිදෙන්නට තැත් දරන්නෝ තමන් ම තමන් ව රවටාගන්නෝ නොවේද? භෞතික සම්පත් කෙරෙහි වන ඇල්ම මඳක් අඩු කරගතහොත් භෞතික වශයෙන් අප ලබනා දියුණුව මඳක් අඩාල වුව ද, මව්පියන් වෙනුවෙන් කෙරෙනා යුතුකම් ඉටුකැ අප ලබාගන්නා මානසික සැනසිල්ලත්, ඉන් ලැබෙනා කායික දියුණුවත් වැඩි කරගත හැකි නොවේද? ඊළඟ සුඛෝපභෝගී වාහනයට, වටිනා දේපලකට මෙහෙයවන සිත මොහොතකට මේ පිළිබඳවත් සිතීමට මෙහෙයවුවොත් නොවේද වඩාත් යහපත් වන්නේ ?

අනුනට දෙසමින් පිටු පිරවීමට අපහට ඇති සුදුසුකම හා අයිතිය කීමෙක් දැයි පාඨකයාට සිතෙනු ඇත. සිතට එකඟව නො වුවද රටින් බැහැරවීමට සිදු වු බව සැබැවි. දෙමව්පියන් ළඟ වැටී ඔවුනගේ කැතකුණු අතගාමින් උපස්ථාන කිරීමට තිබු අවස්ථාවද ඉන් මඟ හැරී ගිය වග සැබැවි. ඒ සංක්‍රමණික අප බො-හොමයකගේ දෛවයයි. මව් බිමේ මව් දෙමව්පියන් වෙත රැඳී සිටිනට අප තරම් අප දියුණු තත්ත්වයක වී නම් කවුරුන්ද නොරටක තනිවන්නට කැමති වන්නේ. එසේ වුවද තමන්ගේ හෘදය සාක්ෂිය දෙන සහතිකයයි කා හට වුවද ඇති උසස්ම සුදුසුකම වන්නේ. තමන් ඒ සුදුසුකම් ලබාගත් ආකාරයේ අනුනට ද දක්-වමින් අනුනට ද උපකාර කිරීමය යුතුකම වන්නේ. අපගේ ප්‍රියන්ත ප්‍රනාන්දු සහෘදයා එද ඉටුකළේ ඒ යුතුකමයි. එවන් යුතුකම් ඉටුකරමි-න් සමාජයට සද්භාවයෙන් යම් අදහසක් ප්‍රකාශ කිරීමේ අයිතියක් ද අවංක ලියන්නෙකු සතු විය යුතුය." පන්හිඳ ලියවිල්ල ඉවර කළා.

මේ මාසේනේ 2600 බුද්ධ ජයන්තිය තියෙන්නේ. ඒ වගේම මේ රටේ මව්වරුන්ගේ දිනය තියෙන්නේත් මේ මාසේ. මට හොඳ අදහසක් ආවා. කාගේ කාගේත් උපන්දින ඒ ඒ අයගේ මව් වරුන්ගේ දිනය විදියට සළක්න්න කියලා ඉල්ලීමක් කරමු." පැන්සල කවදත් අලුත් අදහස් ඉදිරිපත් කරන්න සූරයා.
"ඒක හොඳයි. එතකොට මව්වරුන් ඉන්න අයට පුලුවනි ඒ දවස අම්මලාත් එක්ක ගත කරන්න. පින් අතේ වැඩකරන්න. මව්වරුන් නැති අයටත් පුලුවන් ඒ අයව සිහිකරලා පින් අතේ වැඩ කරන්න. පන්සල් පල්ලි වලට ගිහින් තමන්ගේ ආගමික වතාවත් වල යෙදිලා තමන්ගේ දේවලුත් කරගන්න පුලුවන් නිවාඩු නැති අයට වුණත්." පින්සලත් එකතුවුණා ඒ අදහසට.

"අවුරුද්දකට සැරයක් නිවාඩුවක් දැම්මත් මො-කෝ ? " ඒ පන් "අම්මලා " තාත්තලා මෙහේ ගෙන්න ගත්ත අයටනම් දුකක් හිතන්න දෙයක් නෑ"
"එතකොට පියවරු ? " ඒ පන්

"අපි මේ කතාකරන්නේ කොහෙවත් රටක ඉන්න කවුරුවත් නියම කරපු "මව්වරුන්ගේ දිනයක්" ගැන නෙවෙයිනේ. උපතින්ම මව්වරු අපිට ලබාදුන්න දිනයක් ගැන. මව්වරුන්ට නිකම්ම දරුවො ඉපදෙන්නෙත් නෑනේ. පියවරුත් ඒ දවසට වැදගත් වෙනවා. ඒ නිසා අපේ අදහස ඒ විදියට සංශෝධනය කරමු. ඒ කියන්නේ උපන්දිනය දෙමව්පිය දිනය විදියට සළකන්න කියලා ඉල්ලමු." පැන්සලට නිතරම අලුත් අදහස් ගලාගෙන එනවා.
"2600 බුද්ධ ජයන්තිය වෙලාවෙ හිතට ගන්න කියාපු අදහස" පන්හිඳයි පින්සලයි එක පයින් ම අනුමත කළා.

**Spectrum Migrant Resource Centre (SMRC)**

Funded by the Department of Human Services
for Sri Lankan elderly community

To provide an opportunity to small and emerging communities to meet together weekly and participate in cultural activities led by Staff whom share yoyr cultural and language background.

ශ්‍රී ලාංකික වැඩිහිටි ඔබ වෙනුවෙන් ක්‍රියාත්මක වන වැඩසටහන.
සතිපතා එක්වී අපේ බසින් විවිධ ක්‍රියාකාරකම් වල යෙදන්නට අනගි අවස්ථාවකි මේ. අදම අප අමතන්න.

**Thushari Wickremesinghe - Tel 0433 847 275**
Aged & Disability Service
Small and Emerging Communities Coordinator
251 High Street Preston Vic 3072
www.spectrumvic.org.au